
# උරගුන් හා සබැදුනු ඓතිහාසික හා සංස්කෘතික පසුබිම

ඩබ්.ඒ.හිමාලි ද කොස්තා
පරිසර කළමණාකරණ නිලධාරිනී
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

සර්පයන්, කටුස්සන්, හූනන්, කිඹුලන්, ඉබ්බන්, කබරගොයන්, කැස්බෑවන් හා සිකනලුන් ද මීට අමතරව වසර දස ලක්ෂ 200කට පෙර ජුරාසික යුගයේ ජීවත් වී දැනට නෂ්ට ව ඇති ඩයිනොසෝරයන් ද උරගයන්ට අයත් වේ. මොවුන් ගොඩ බිම වාසයට හොදින් අනුවර්තනය වී ඇති සත්ත්ව කාණ්ඩයකි. බොහෝ උරගයන් ගාත්‍රා යුගල් දෙකක් දරන අතර මෙම ගාත්‍රා පංචාගුලික ගාත්‍රා වේ. මෙම ගාත්‍රා යුගල් දෙක බොහෝ දුරට එක සමාන වේ. එහෙත් සර්පයෝ ගාත්‍රා නො දරති. උරගයෝ අස්ථිමය අභ්‍යන්තර සැකිල්ලක් දරති. වියළි සමක් ඇති මොවුහු පෙනහැලි මගින් ශ්වසනය සිදුකරති. චලතාපීහු ය. අභ්‍යන්තර සංසේචනය සිදු වේ. කවච සහිත බිත්තර දමති. මොවුහු ජල සංරක්ෂණයට අනුවර්තන පෙන්වති.

දැනට ශ්‍රී ලංකාවේ උරග විශේෂ 171ක් හමු වන අතර ඉන් විශේෂ 101ක් අප රටට ආවේනික වේ (2007 රතු දත්ත පොත). මෙම උරගයෝ පාංශු, භෞමික, රුක්වැසි හා ජලජ පරිසර පද්ධතිවල ජීවත් වෙති. උරගයන් ස්වාභාවික පරිසර සමතුලිතතාවට මෙන් ම මිනිසාටත් ඉතා ම වැදගත් වන සත්ත්ව කොට්ඨාසයකි. ඔවුහු විවිධ කෘමීන්, කකුළුවන්, මීයන්, කුඩා ක්ෂීරපායීන්,උභය ජීවීන්, උරගයන් හා පක්ෂීන් ආදී සතුන් ආහාරයට ගනිති. කබරයන් කුඹුරුවල වේලි මෙන් ම අස්වැන්න ද විනාශ කරන මීයන් හා කකුළුවන් ආහාරයට ගන්නා අතර තලගොයි පොල් කුරුමිනියන් ආහාරයට ගනිති. කිඹුලන් ඔවුන් ජීවත් වන ජලාශවල පරිසරය යහපත් අන්දමින් පවත්වා ගැනීමට උපකාරී වේ. වනාන්තර එළි කිරීම, වාසස්ථාන කැබැලි වීම මෙරට උරගයන් මුහුණපාන ප්‍රධානම තර්ජන වේ.



පොළඟා



කබරගොයා

විශාල උරගයින් සංඛ්‍යාවකට වාසභූමිය වූ මෙරට සංස්කෘතියට, කලාවට, නර්ථනයට, විශ්වාස හා ඇදහිලි වලටද උරගයින් හා බැදුනු සම්බන්ධතාවයක් දක්නට ලැබේ. මෙයට හේතුව වසර දහස් ගණනක් මිනිසා ඔවුන් සමග එක්ව ජීවත්වීම විය හැකිය. මේ ලිපියේ අරමුණ උරගයින් හා අප අතර පවතින එම සබදතාවය පිළිබඳ සොයා බැලීමයි.

මීට වසර 37000-6000 අතර කාලපරාසයක ජීවත් වූ බලංගොඩ මානවයා වාසය කල ගල් ගුහා වල සිදුකල කැනීම් වලදි නාගයින්, කටුස්සන් වැනි උරගයින් ගේ සාධක හමුවි ඇත. බලංගොඩ මානවයන් ගල් ගුහා හා විවෘත භූමි වල දඩයක්කරුවන් ලෙස ජීවත් වුවන්ය. ඔවුන් විසින් මෙම උරගයින් දඩයම්කර ආහාරය සඳහා යොදා ගත්තේ යැයි සැලකේ. අනුරාධපුර රාජධානියේ සිදුකරන ලද කැනීම් වලදී ද එහි මුල් පදිංචිකරුවන් උරගයින් ආහාර වශයෙන් යොදාගත් බවට සාක්ෂි හමුවී ඇත. එනම් කිරි ඉබ්බන් /soft shell terrapin (*Lissėmys punctata*) ,ගල් ඉබ්බන් / hard shell terrapin *(Melanochelys trijuga)* බටු කැස්බෑවන්/ olive ridley sea terrapin *(Lepidochelys olivacea)* සහ තලගොයින් / land monitor(*Varanus bengalensis*) වැනි සතුන්ගේ ඇටකටු ඉපැරණි භූ ස්ථර වලින් හමුවි ඇත.



කටුස්සා

ක්‍රි.ව 1 වන සියවසේදී පමණ ලියන ලද "පේරිප්ලූස් ඔෆ් ද එරිත්‍රියන්" නම් ග්‍රන්ථයේ මෙරටින් ඉදිබු කටු පිටරට යැවූ බව සඳහන් වේ. මේ හැරුනු විට අතීතයේ විසූවන් කටුස්සන් (Heydt 1744) හා පිඹුරු මස් :Daraniyagal 1954) ආහාරයට ගත් බව පැවසේ.

උරගයින් අතුරින් නාගයින් කෙරෙහි අද දක්වාම ලාංකිකයන් තුල භක්තියක් හා ගෞරවයක් පවති. අද දක්වාම බොහෝ ගැමියන් නාගයන්ට හිංසා කිරීමට ඉදිරිපත් නොවේ. ඔවුන් ඇතැම් විට නාගයන් දේවත්වයේලා සලකන අවස්ථා දක්නට ලැබේ. එමෙන්ම යම් යම් වස්තූන් හා ධන නිධාන ආරක්ෂා කර ඇති ස්ථාන වල නාග පෙණයේ ආකෘතියක් කොටා ඇති ආකාරයෙන් ඒ බව පැහැදිලි වේ. මීට අමතරව ගැමියන් අතර පවතින තවත් විශ්වාසයක් වන්නේ නාගයන්ට කරදරයක් කලහොත් නාගයා ඒ පුද්ගලයා කෙරෙහි වෛර බඳින බවයි. ඒ නිසා අතීතයේ දී මෙන්ම අද ද ගැමියන් බොහෝ විට නාගයන් මැරීමට ඉදිරිපත් නොවේ. නාගයෙක් තම වත්තට ආවිට කරුණාවෙන් ආමන්ත්‍රණය කර "අනේ නයිහාමි අපිට කරදර නොකර ආපහු යන්න. මෙවැනි අපිරිසිදු ස්ථාන ඔබට සුදුසු නොවේ" වැනි ආයාචනාත්මක ඉල්ලීමක් කර නාගයින් පලවා හරී.



හූනා

අතීතයේදී ලංකාවේ "නාග" නමින් ගෝත්‍රයක් ද සිටි බව ද ඔවුන් දක්ෂ නාවිකයන් බවද ඒ පිළිබඳව තොරතුරු සොයා බැලීමේදී පැහැදිලිවේ. බුදුරජාණන් වහන්සේ පලමුවර ලංකාවට වැඩම කලේ චූල්ලෝදර හා මහෝදර යන නා රජුන් දෙපලගේ මැණික් පුටුවක් සම්බන්ධ අරගලයක් සංසිඳවීමට බවත්, තෙවන වර ලංකාවට වැඩම කලේ මනිඅක්ඛිත නා රජුගේ ආරාධනයෙන් බවත්, ඉතිහාසයේ සඳහන් වේ. ඒ අනුව. "නාග" නමින් ලංකාවේ අතීතයේ වාසය කල ගෝත්‍රය ඉතා දියුණු ජන කොට්ඨාශයක් බව පැහැදිලි වේ.

අතීතයේදී "නාග" යන්න "උතුම්" යන අර්ථයෙන් ව්‍යවහාර වූ බව පැරණි සෙල්ලිපි වලින් පෙනේ. පැරණි සෙල්ලිපි වල රජුන් පිළිබඳව සඳහන් කරන විට "නක" "නාග" යන වචන භාවිතා කර තිබේ. "අභය මහරජ පුතෙ දෙවානපිය නක මහරජේ" යනුවෙන් මහරත්මලේ සෙල් ලිපියේ සඳහන් වේ.එමෙන්ම ලක්දිව රාජනාමාවලියේ බොහෝ රජවරුන්ගේ නමට "නාග" යන වචනය සම්බන්ධ වේ. උදා: ඉලනාග, සිරිනාග, චෝරනාග.

පැරැන්නන් නාගයා ජලයට අධිපති දෙවියා ලෙස සලකන ලදි. වැව්, පොකුණු ආදිය සෑදුවිට ඒ ආශ්‍රිතව නාග රූප සවිකරන ලදි. නාග රූප පොකුණු ආශ්‍රිතව යෙදීමෙන් ජලය අඩුනොවන බවට විශ්වාසයක් පවතී. උදා : මිහින්තලයේ නාග පොකුණ මීට අමතරව ආරාම වල නාග ගල් දක්නට ලැබේ. මුරගල් වල , දොරටුපාල රූප වලට පිටුපසින් නාග පෙණ 05/07 නෙලා ඇත කුට්ටම් පොකුණේ පංචනාගදරණය අනුරාධපුරයේ මානන්කට්ටිය සොරොව්වේ පෙණ 07 කින් යුතු නාග රූපය ඉතා අලංකාර නිර්මාණයන්ය. මේවා ආරක්ෂාව සංකේතවත් කරමින් යොදාගෙන ඇති බව සිතිය හැකිය.



සිකනලා

## මිහින්තලයේ නාග පොකුණ

කැටයම් හා පාරම්පරික කර්මාන්ත වලද රටා නිර්මාණයේදි ද නාග රූපය යොදා ගෙන ඇත. පන්නම් කර්මාන්තයේ එන "නයි දඟරය" ඊට උදාහරණ වේ. ඒ බව පන්නම් කර්මාන්තය ආශ්‍රිතව ඇති ජන කවියකින් දැක්වේ.

ඇයි ලඳුනේ දැන් මැසිවිලි කියන්නේ
."නයි දඟරේ" පැදුරේ වට පුරන්නේ
කොයි දෙසිනේ මානෙල් මල් පිපෙන්නේ
වෙයි ගුවනේ ඉර හඳ තරු දිලෙන්නේ

එසේම පහත රට නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්ම වලදී යොදා ගන්නා වෙස් මුහුණු වලටද නාග රුව සම්බන්ධය. උදා : නාග රාක්ෂ වෙස් මුහුන හා ගුරුලු රාක්ෂ වෙස් මුහුන



කැස්බෑවා



ඉබ්බා

උඩරට නර්තන කලාවේ වැදගත් අංගයක් වන දහඅට වන්නමේ ඇතුලත් වන "නයිඅඩි වන්නම" නාගයාගේ ගමන් විලාශය අනුවත් "උරගා වන්නම" සර්පයාගේ ගමන් විලාශය අනුවත් නි ර්මාණය වි ඇත.

ජ්‍යෝතිෂ්‍ය අනුව රාහු නැමති ග්‍රහයාට නාග හිසක් ඇති බවට විශ්වාස කෙරේ. ඒ අනුව රාහුගෙන් ඇතිවන අපල උපද්‍රව සඳහා නාගපෙණයේ ආකෘතිය ඇති මුදුවක් පැලඳීම ද සිංහල ජනයා අතර දක්නට ලැබේ.එමෙන්ම අතීතයේ දී නාගයින් ඇදහීම ලංකාවේ පැවති බවට සාක්ෂි පවතී.

ලාංකික අහිකුණ්ඩික ජනතාව විසින් අද දක්වාම සිදුකරනු ලබන "නයි නැටවිම" මගින් ඔවුන් තම ජීවනෝපාය සලසා ගනී.

දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ සර්ප විෂ වෙදකමට විශේෂ තැනක් හිමිවේ. දුටුගැමුණු හා බුද්ධදාස වැනි රාජ්‍ය යුග වල සර්ප වෙදකම ව්‍යාපත්ව පැවති බව කියැවේ. දුටුගැමුණු රජතුමා අවස්ථා කීපයකදීම සර්ප දෂ්ඨ කිරිම් වලට ගොදුරුවු බවත් අවසානයේදී සර්ප දෂ්ඨයකින්ම මිය ගිය බවත් ජනප්‍රවාදයේ දැක්වේ. බොහෝ අවස්ථා වල සර්ප දෂ්ඨයන්ගෙන් දුටුගැමුණු රජතුමා සුවපත් කර ඇත්තේ "කපුරුනාද" නම් අති දක්ෂ විෂ වෙදගුරුතුමා බවද ප්‍රවාදයේ දැක්වේ. මහාවංශයට අනුව දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ නිපුන බුද්ධදාස රජතුමා රෝගීවු නාගයෙකුට පවා බෙහෙත් කර සුවපත් කල බව දැක්වේ.

සර්ප විෂ වෛද්‍යවරයාට අතීත ජන සමාජයේ විශේෂ තැනක් හිමි විය. සර්පයෙකු දෂ්ඨ කල විට ඒ පුවත රැගෙන යන දූතයාගේ හැසිරීම් අනුව දෂ්ඨ සර්පයා, රෝගියා බේරාගත හැකිද නොහැකිද යන බව දැනගැනීමේ හැකියාව විෂ වෙදුරුන් සතු විය. ඒ හා බැඳුනු පාරම්පරික දැණුම් සම්භාරයක් ඔවුන් සතුව පැවතුණි

සාමාන්‍යයෙන් උරගයින් සුරතල් සතුන් ලෙස ඇතිකරනු නොලැබුවත් එවැනි අවස්ථාවක් පිළිබඳ තොරතුරක් පහත දැක්වෙන ජනකවියෙන් ප්‍රකාශ වේ.


මං බාලේ ඇති කළ තලගොයි පැටියා
මට තනිවට මිදුලේ මේ කෙළ සිටියා
රුදු මරුවා ඇවිදින් උෟ අරන් ගියා
අනේ මගේ සුරතල් තලගොයි පැටියා

අප නිවෙස් වල බොහෝ විට දක්නට ලැබෙන උරගයෙකු වන "හූනා" අනාවැකි පල කරන්නෙකු ලෙස අතීතයේ සිට පිළිගත් බව රොබට් නොක්ස් ගේ වාර්තා අනුව පැහැදිලිවේ. හූනා හඬ නගන දිශාව අනුව, හූනා වැටෙන සිරුරේ ස්ථානය අනුව අනාවැකි පල කිරීම "හූනු ශාස්ත්‍ර" නමින් හදුන්වනු ලැබේ. මේ හැරුනු විට ගැරඬියා, තලගොයා, කබරගොයා ආදී උරගයන්ගේ හැසිරීම් රටාවන් අනුවද අනාවැකි පලකරනු ලැබේ. එමෙන්ම විවිධ උරගයන් / සර්පයින් ආශ්‍රිතව ගොඩනැගුනු කතාන්දර, ජනප්‍රවාද හා ප්‍රස්ථා පිරුලු ද රාශියක් අප සංස්කෘතිය තුල දක්නට ලැබේ. උදා: "නායාට ගහලා පොල්ල වරද්ද ගත්තා වගේ" "ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වගේ" "කන්න ඕන උනාම කබරගොයාත් තලගොයා වෙනවා" "කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ"

ඊට අමතරව උරගයින්ගේ යම් යම් හැසිරීම් රටා අනුව කාලගුණය පිළිබඳව අනාවැකි පළකිරීමේ හැකියාව ගැමියන් සතුය. ඒ අනුව ග්‍රීස්ම සමයේ කටුස්සන් එක දිගට කෑ ගැසීම (සිවුරුම්බෑම) ඉදිරි සතියේ වර්ෂාවක් ඇතිවන බව සනාථ කරන බව ගැමියන්ගේ විශ්වාසයයි.

එමෙන්ම උරගයින් ආශ්‍රිතව ගොඩනැගුනු ග්‍රාමනාම (උදා: නාගදීප, නයිවල,ඉබ්බන්වෙල, කිරිඉබ්බන් වැව) හා පුද්ගල නාම( උදා: නාගසිංහ) විශාල සංඛ්‍යාවක් ද අප අතර දක්නට ලැබේ









බුදුරජාණන් වහන්සේ චූල්ලෝදර හා මහෝදර යන නා රජුන් දෙපලගේ මැණික් පුටුවක් සම්බන්ධ අරගලයක් සංසිදවීමට තෙවන වර ලංකාවට වැඩම කිරීම